**රුහුණ විශ්වවිද්‍යාලය - 2023**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත් පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව.
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැල්ලමඩම පරිශ්‍රයේ සහ කෘෂිකර්ම විද්‍යා පීඨයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉකුත් වර්ෂවලදී වැය කරන ලද රු.56,952,897 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ බැවින් දේපළ, පිරියත හා උපකරණ ගිණුම හා සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන) එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් විශ්වවිද්‍යාලය විසින් කිහිප වරක්ම ඉල්ලුම් කලද, ඔවුන් අදාළ පිරිවැය සහ විස්තර ලබා දීමට කටයුතු කර නොමැත. අදාල ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලයේ අනෙකුත් මාර්ග කාපට් කිරීම සඳහා ඉල්ලුම් කර ඇති අතර අදාළ සියලු වැඩ අවසන් වූ පසු ගිණුම් කටයුතු කිරීමට ඉදිරි වර්ෂයේදී කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය ගණනය කිරීමේදී රු.145,176,156 ක් ගෙවිය යුතු වැට් බදු (VAT) ඇතුළත් නොකිරීම නිසා කොන්ත්‍රාත් ණයහිමි ශේෂය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මිල විචලන සම්බන්ධයෙන් අදාල TEC අනුමැතිය 2023.12.31 දින වන විටත් ලැබී නොමැති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි සාධාරණ අගයන් ඉදිරිපත් කල යුතු බැවින් මිල විචලනයට අදාල දළ ඇස්තමේන්තු අගය පදනම් කරගෙන සටහන් අංක 15 යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව. | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ වැඩිපුර ගෙවන ලද රු.2,726,945 ක කාර්ය මණ්ඩල වැටුප් අයවිය යුතු වැටුප් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට එම ප්‍රමාණය පිළිවෙලින් හර හා බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී එම මුදල බැඳුම්කර කඩකිරීම් | ලැබිය යුතු අගයන් Bond Violation and other dues එකම ගිණුමක පෙන්වීමේදී අපැහැදිලිතාවයක් මතුවන හෙයින් ඉදිරි වර්ෂයේදී other dues වෙනුවෙන් වෙනම ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | අදාළ ගිණුම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදල් ගිණුම (Bond Violation Account) බැර කර ලැබිය යුතු බැඳුම්කර කඩකිරීම් ගිණුම (Bond Violation Receivable Account) හර කර තිබුණි. | | |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන යටතේ වර්ෂයට අදාල ශිෂ්‍යාධාර රු.77,486,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ ආදායම හා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | රජයේ ප්‍රදාන හා එහි වියදම නිවැරදිව ගිණුම්වල නිරූපණය කළ යුතුය. |
| (ඈ) | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික රු.2,573,585 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ පාරිතෝෂික වියදම හා පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ පාරිතෝෂික ගණනයේදී සමස්ථ ශේෂය වන රු.2,573,585 ක් අඩුවෙන් දක්වා ඇති බැවින් 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු සලසා ඇති බව. | පාරිතෝෂික වෙන්කිරීම් නිවැරදිව ගණනයකර ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පැවත එන එකතුව රු.36,044,249 ක් වූ තැන්පත් ශේෂයන් 34 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙවන තෙක් කෙරීගෙන යන කොන්ත්‍රාත් සහ අඩුපාඩු සකසා විශ්වවිද්‍යාලය වෙත ලබා නොදීම මත රඳවාගෙන ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.4,611,856,429 ක දේපළ පිරියත හා උපකරණ සහ රු.27,070,448 ක් වූ අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | රුහුණ විශ්වවිද්‍යාලය විසින් එක් එක් අංශයන්හි ස්ථාවර වත්කම් සඳහා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යන අතර, එම පද්ධතියේ සියලු අංශයන්ට අදාල වත්කම් සම්බන්ධයෙන් වාර්තා බාගත කරගත හැකි බව. | සියලු වටිනාකම් ඇතුලත් උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,005,010,989 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.888,979,918 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.116,031,071 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමක් සමඟ එකඟ වූ ගිවිසුම, සමාගමේ දුර්වල කාර්යසාධනය මත 2020 ජනවාරි 03 දින අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් 2022 නොවැම්බර් 30 දින ලංකා බැංකුවෙන් ලැබුණු රු.42,544,131 ක කාර්යසාධන බැඳුම්කර වටිනාකම එම කර්මාන්තය සඳහා යෙදවීමකින් තොරව සැපයුම් හා බැඳුම්කර කඩකිරීමේ ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | වෛද්‍ය පීඨයේ මහල් 12 ක ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ පළමු කොන්ත්‍රාත්කරු විසින් අදාල ඉදිකිරීම් සම්බන්ධව විශ්වවිද්‍යාලයට එරෙහිව බේරුම්කරන නඩුවක් පවරා ඇත. මේ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා සිටි අතර උපදෙස් ලද විගස ආදායමට ගැනීමට හෝ තවදුරටත් රඳවා ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියට අදාළ මුදල් එම ව්‍යාපෘතිය වෙනුවෙන් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල භූමියේ ඉදිකර තිබුණු දුරකථන කුළුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් අය විය යුතු රු.5,387,070 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එම ශේෂය තුළ 2014 – 2021 වර්ෂ සඳහා රු.1,763,613 ක් ද 2022 වර්ෂය සඳහා රු.1,172,651 ක් සහ 2023 වර්ෂය සඳහා රු.2,450,806 ක් වශයෙන් අයවිය යුතුව පැවතුණි. | පිළිතුරු දී නොමැති බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයෙකු වශයෙන් සේවය කරන ලද රුහුණ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවූ වැටුප් හා දීමනා වලින් රු.1,255,525ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් එම ආයතනයෙන් අයවිය යුතුව පැවතුණි. | ඉතිරි ශේෂය අය කිරීම සම්බන්ධව එම අධිකාරිය දැනුවත් කර ඇති බව. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය වෙත භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත්වීම මත සැපයුම්කරුවන්ගෙන් අය කරනු ලැබූ ප්‍රමාද ගාස්තු සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත ප්‍රසම්පාදන කමිටුව ආපසු ගෙවීමට තීරණය කිරීමෙන් 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.2,127,306 ක් හා රු.413,454 ක් විශ්වවිද්‍යාල අරමුදලට අහිමි වී තිබුණි. | ගිවිසුම් කඩකිරීම මත අයකර ගත් ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත සැපයුම්කරුවන්ට ගෙවීම් කර ඇති බව. | ගිණුම්ගත කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දී ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය විසින් රු.9,524,500 ක වියදමක් දරා අත්පත්කර ගත් අක්කර 03 ක ඉඩම අදාල කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | COVID-19 වසංගතය හේතුවෙන් අපේක්ෂා කර තිබූ මට්ටම දක්වා ඉඩම සංවර්ධනය කිරීමට නොහැකි වූ අතර, එම ඉඩමෙහි ඉදිකිරීමට අපේක්ෂා කරන ක්‍රීඩා භූමියෙහි දළ සැළැස්ම 2023.10.05 දින පැවති විශ්වවිද්‍යාලීය ඉඩම් හා ගොඩනැගිලි කමිටු රැස්වීම සඳහා යොමුකර අනුමතකර ඇති බව. | මිල දී ගත් වත්කම් අදාල කාර්යය සඳහා යොදා ගත යුතුය. |
| (ආ) | පර්යේෂණ හා ව්‍යාපෘති සඳහා වෛද්‍ය පීඨයට ලැබී තිබුණු රු.1,408,463ක මුදල වසර 04 කට අධික කාලයක සිට උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැති බව. | ලැබුණු මුදල් අදාල කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |